# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# வருடாந்த செயற்பாட்டு அறிக்கை

# ANNUAL PERFORMANCE REPORT

# 2015

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

கருத்திட்ட முகாமைத்துவம் மற்றும் கண்காணிப்புத் திணைக்களம்

தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சு

**Department of Project Management and Monitoring**

**Ministry of National Policies and Economic Affairs**

# පටුන


01. හැඳින්වීම........................................................................................................ 1

02. දැක්ම, මෙහෙවර, අරමුණු හා ඉලක්ක........................................................................ 2

03. සංවිධාන ව්‍යුහය.................................................................................................... 3

3.1 දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු................................. 3

3.2 අයවැය තොරතුරු........................................................................................ 4

04. දෙපාර්තමේන්තුවේ කාර්යභාරය.............................................................................. 4

4.1 අධීක්ෂණ ක්‍රමවේදයන්................................................................................... 5

4.1.1 දේශීය සහ විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය අධීක්ෂණය කිරීම.................................................. 5

4.1.2 ප්‍රගති වාර්තා මඟින් අධීක්ෂණය කිරීම................................................ 6

4.1.3 ක්ෂේත්‍ර චාරිකා මගින් ප්‍රගතිය අධීක්ෂණය කිරීම.............................. 6-8

4.1.4 විශේෂ රැස්වීම් සහ සාකච්ඡා පැවැත්වීම............................................ 8-9

4.1.5 ඇගයීම් තොරතුරු පද්ධතිය (EIS) පවත්වාගෙන යාම......................... 9-10

05. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ වූ තාක්ෂණික සහයෝගීතා ව්‍යාපෘතිය........................................................................................................ 10

06. විශේෂ ක්‍රියාකාරකම්

6.1 “ සංවර්ධන ව්‍යාපෘතීන්හි කාර්යසාධනය - 2015” ප්‍රකාශයට පත් කිරීම............. 10

6.2 දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු මගින් ක්‍රියාත්මක වූ සංවර්ධන ව්‍යාපෘති ඇගයීම.......................................................................................... 10

6.3 දින 100 වැඩසටහන........................................................................... 11

6.4 පෝෂණ වැඩසටහන............................................................................... 11

07. කාර්යමණ්ඩල පුහුණු කිරීම සහ හැකියා වර්ධනය......................................................11-12

ඇමුණුම

ඇමුණුම 01 - සංවිධාන ව්‍යුහය

ඇමුණුම 02 - අයවැයගත තොරතුරු පිළිබඳව සවිස්තරාත්මක වාර්තාව

## 01. හැඳින්වීම

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම වගකීම වනුයේ රජයේ සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘතීන් කඩිනමින් සහ ඵලදායි ලෙස ක්‍රියාත්මකවීම තහවුරු කිරීම සඳහා අදාල සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘති අධීක්ෂණය කිරීම සහ ඇගයීමට ලක්කිරීමයි.

2015 වර්ෂය ආරම්භයේදී පත් වූ නව රජයේ සංවර්ධන සැලැස්ම සහ දින 100 කඩිනම් සංවර්ධන වැඩසටහනට අනුව, රට තුළ තිරසාර ආර්ථික වර්ධනයක් සමඟ සමතුලිත ප්‍රාදේශීය සංවර්ධනයක්ද ළඟා කර ගැනීම සමස්ත සංවර්ධන ඉලක්කය විය. මෙම ජාතික අරමුණ සාක්ෂාත් කර ගැනීමෙහිලා දෙපාර්තමේන්තුව විසින් දින 100 කඩිනම් සංවර්ධන වැඩසටහන සහ ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටුවෙහි තීරණයන් ක්‍රියාත්මකවීමේ ප්‍රගතිය සෑම සතියකම අධීක්‍ෂණය කර අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත වාර්තා කරන ලදී. ඒ අනුව, රටෙහි සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමෙහිලා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව පුළුල් භූමිකාවක් ඉටු කර ඇත.

එසේම රේඛීය අමාත්‍යාංශ හරහා ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතීන්හි ක්‍රියාකාරීත්වය ද සෑම මසකම ඒවායේ සැලසුම් අනුව විශ්ලේෂණය කිරීම තුළින් ඒවායේ සුමට ක්‍රියාකාරීත්වය සඳහා මගපෙන්වීමත් පහසුකම් සැලසීමත් සිදු කරනු ලැබේ. මෙයට අමතරව සංවර්ධන හවුල්කරුවන්, ව්‍යාපෘති කාර්ය මණ්ඩල සහ අදාළ අනෙකුත් ආයතන සමග සිදු කරනු ලබන ආංශික සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් මඟින් සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළ ගැටළු නිරාකරණය කිරීම සඳහා ද දෙපාර්තමේන්තුව අවශ්‍ය පහසුකම් සලසනු ලැබේ. තවද, සංවර්ධන ව්‍යාපෘතීන් හි කාර්තුමය ප්‍රගතිය ප්‍රගති වාර්තා මඟින් ඉදිරිපත් කරනු ලබන අතර එම තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා ව්‍යාපෘතීන් හි බිම් මට්ටමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම පිණිස ක්ෂේත්‍ර චාරිකා ද සිදු කරනු ලැබේ.

තත් අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහිලා මෙම දෙපාර්තමේන්තුව ප්‍රධාන සංවර්ධන තේමාවන්ට අනුව අංශ 05ක් යටතේ එම සියලුම අධීක්ෂණ කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා පහසුකම් සැපයීමට ආයතන හා මූල්‍ය කටයුතු සඳහා වෙන්වූ අංශයක්ද ඇතුළුව අංශ 05ක් යටතේ ව්‍යුහගත කර ඇත. මෙම වාර්තාව මඟින් දෙපාර්තමේන්තුවේ 2015 වසර තුළ කාර්යසාධනය ඉදිරිපත් කෙරේ.

## 02. දැක්ම, මෙහෙවර, අරමුණු සහ ඉලක්ක

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, අරමුණු සහ ඉලක්ක සකස් කිරීමේ දී ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු කර ඇත්තේ රජයේ සංවර්ධන අරමුණු සහ ඉලක්ක ඵලදායි අයුරින් ළඟා කර ගැනීම උදෙසා දෙපාර්තමේන්තුවේ කාර්යභාරය කෙසේ සකස් විය යුතු ද යන්න කෙරෙහිය.

**දැක්ම**

"සඵලදායි සංවර්ධනයක් අත්පත් කර ගැනීම උදෙසා ප්‍රධාන හවුල්කරු වීම"

**මෙහෙවර**

"ප්‍රතිඵල සහතික කිරීම පිණිස රජයේ සියලු සංවර්ධන ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘතීන් අධීක්ෂණය කිරීමේ සහ ඇගයීමේ කේන්ද්‍රස්ථානය වශයෙන් කටයුතු කිරීම"

**අරමුණු / ඉලක්ක**

i. රජයේ ප්‍රතිපත්ති,වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක වීම පිළිබඳව ප්‍රගතිය අධීක්ෂණය සහ පසු විපරම් කිරීම.

ii. විදේශ අරමුදල් යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘතිවල මෙහෙයුම් කටයුතු අධීක්ෂණය කිරීම සහ එම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය අර්ධ වාර්ෂික වාර්තා මගින් ප්‍රකාශයට පත් කිරීම. එම ව්‍යාපෘතීන් හි ප්‍රගතිය වේගවත් කිරීමට සහාය වීම සහ එම අරමුදල් භාවිතා කිරීමේ දුර්වලතා මගහරවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම.

iii. රාජ්‍ය ආයෝජන සැලැස්මේ සඳහන් ඉතා වැදගත් සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණයට භාජනය කිරීම සහ එම ව්‍යාපෘතීන් නියමිත කාල සීමාව තුළ නිසි පරිදි ක්‍රියාත්මක කිරීම මඟින් ආර්ථික සංවර්ධනය වේගවත් කිරීමට අවශ්‍ය මගපෙන්වීම.

iv. විදේශ ආධාර ව්‍යාපෘතීන් හි කාර්ය සාධනය විමර්ශනය කිරීම සඳහා අරමුදල් සම්පාදකයින් සමඟ ඒකාබද්ධව ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම හා එම තීරණයන් අදාළ පාර්ශවයන් වෙත දන්වා යැවීම.

v. රජයේ දින 100 සංවර්ධන වැඩ සටහන ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය අධීක්ෂණය හා වාර්තා කිරීම සොයා බැලීම.

vi. ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටුවෙහි තීරණයන් ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය පසු විපරම් කිරීම හා වාර්තා කිරීම.

vii. රේඛීය අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වන රාජ්‍ය ව්‍යවසායන් හි 2015 – 2017 ප්‍රතිඵල පාදක රාමුව සකස් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම සහ අදාළ දැනුවත් කිරීම් හා මගපෙන්වීම් සිදුකිරීම තුළින් එම ආයතනවල ප්‍රගතිය කාර්තුමය වශයෙන් ඇගයීමට ලක්කිරීම.

viii. තෝරාගත් ප්‍රධාන ව්‍යාපෘති හා වැඩසටහන් ඇගයීම සහ එමගින් ඉදිරි ව්‍යාපෘති සැලසුම් සකස් කිරීම සඳහා මගපෙන්වීම් ලබා දීම.

ix. සෞඛ්‍ය අංශයෙහි විදේශ අරමුදල් වැයයෝජනය හා සම්බන්ධ වූ දර්ශක (DLIs) අත්පත් කර ගැනීමේ ප්‍රගතිය, එම අරමුදල් ලබා ගැනීම සඳහා සහතික කර ඉදිරිපත් කිරීම.

x. දෙපාර්තමේන්තුවේ ආයතන හා පරිපාලන කටයුතු කළමනාකරණය සහ ව්‍යාපෘති අධීක්ෂණය සහ ඇගයීම ශක්තිමත් කිරීම.

## 03. සංවිධාන ව්‍යුහය

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව අධ්‍යක්ෂ ජනරාල් සහ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් තිදෙනෙකුගේ සෘජු අධීක්ෂණය යටතේ අංශ 05 ක් මගින් ක්‍රියාත්මක වේ. එම අංශ පහත පරිදිය.

I. කෘෂිකර්ම, වාරිමාර්ග හා පාරිසරික සංවර්ධන අංශය
II. ආර්ථික යටිතල පහසුකම් සංවර්ධන අංශය
III. මානව සම්පත් සංවර්ධන අංශය
IV. රාජ්‍ය පාලන, කර්මාන්ත හා මුදල් අංශය
V. මූල්‍ය හා ආයතන අංශය

ඉහත අංශ අතුරින් මූල්‍ය හා ආයතන අංශය දෙපාර්තමේන්තුවේ කාර්යභාරය කාර්යක්ෂමව ඉටු කිරිමට අවශ්‍ය සහායක සේවාවන් සලසන අතර අනෙකුත් සියලුම අංශ සෘජුවම සංවර්ධන ව්‍යාපෘති කළමනාකරණයට සහ අධීක්ෂණයට අදාළ කාර්යයන් හි නියුක්ත වේ. (සංවිධාන ව්‍යුහය - ඇමුණුම් අංක 01)

### 3.1 දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු

2015.12.31 දින වන විට දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත පරිදි විය.

**වගු අංක 01**
**කාර්ය මණ්ඩල තොරතුරු**

| කාර්ය මණ්ඩල වර්ගීකරණය | අනුමත කාර්ය මණ්ඩලය | තථ්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| විධායක ශ්‍රේණියේ නිලධාරී | 37 | 29 | 08 |
| ද්විතීය මට්ටමේ නිලධාරී | 35 | 23 | 12 |
| තෘතීය මට්ටමේ නිලධාරී | 01 | 01 | - |
| ප්‍රාථමික මට්ටමේ නිලධාරී | 19 | 17 | 02 |
| එකතුව | 92 | 70 | 22 |


### 3.2 අයවැය තොරතුරු

2015 වර්ෂය සඳහා අනුමත වූ වියදම් ඇස්තමේන්තුව සහ වාර්ෂික වියදම ප්‍රස්ථාර අංක 01 මඟින් ඉදිරිපත් කෙරේ. අයවැයගත තොරතුරු පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් ඇමුණුම අංක 02 ලෙස ඉදිරිපත් කර ඇත.

ප්‍රස්ථාර අංක 01
අයවැය තොරතුරු - 2015

වගු අංක 02
ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් - 2015

| ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් - 2015 (රු.මි) | | |
|---|---|---|
| වියදම් වර්ගීකරණය | ඇස්තමේන්තුව | සත්‍ය වියදම |
| ප්‍රාග්ධනවියදම් | 78.68 | 13.15 |
| පුනරාවර්තනවියදම් | 21.94 | 78.62 |
| එකතුව | 100.62 | 91.77 |




### 4.0 දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

2015 වසරේ පත්වූ නව රජය තිරසාර ඉහල ආර්ථික වර්ධනයක් ලබා ගැනීමේ අභිලාශයෙන් රජයේ සංවර්ධන සැලැස්ම**"දින 100 කඩිනම් සංවර්ධන සැලැස්ම"** ලෙස ක්‍රියාත්මක කරන ලදී. පුළුල් රාජ්‍ය අරමුණුවලට සමගාමීව සාමාජීය හා ප්‍රදේශීය විෂමතාවයන් අවම කරමින් අඩු ආදායම්ලාභී ජනතාවගේ ජීවන තත්ත්වය නගාසිටුවීම සඳහා ජාතික සංවර්ධන වැඩසටහනක් 2015 වර්ෂයේ ක්‍රියාත්මක කර ඇත.

විශේෂයෙන් ප්‍රාදේශීය වශයෙන් හා ආංශික වශයෙන් පසුබෑමකට ලක්වූ ක්ෂේත්‍රයන් හඳුනා ගනිමින් 2015 වාර්ෂික ඇස්තමේන්තු අනුව දියුණු කළ යුතු දිස්ත්‍රික්ක කීහිපයක් විශේෂ ආර්ථික කලාප ලෙස හඳුනා ගන්නා ලදී. මේ අනුව රජය මගින් ප්‍රධාන සංවර්ධන තේමාවක් පාදක කර ගනිමින් එක් එක් රේඛීය අමාත්‍යංශ යටතේ කුඩා, මධ්‍යම හා මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් 1051ක් ක්‍රියාත්මක කර ඇත. මෙම ව්‍යාපෘති අතුරින් ව්‍යාපෘති 306ක පිරිවැය ඇස්තමේන්තුව රුපියල් මිලියන 500 ඉක්මවා යන මහා පරිමාණ ව්‍යාපෘති වේ. සමස්ථ පිරිවැය ඇස්තමේන්තුවට අනුව ව්‍යාපෘති වර්ගීකරණය වගු අංක 03 හි දක්වා ඇත.

මීට අමතරව, රජයේ දින 100 සංවර්ධන වැඩ සටහන ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය අධීක්ෂණය හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටුවෙහි තීරණයන් ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය පසු විපරම් කිරීම හා වාර්තා කිරීම සිදු කරන ලදී. 2015.05.19 දින සිට අනු කමිටු තීරණයන්හි ප්‍රගතිය සතිපතා හා මාසික වාර්තා මගින් එම කමිටුවට ඉදිරිපත් කරනු ලැබීය.

**වගු අංක 03**

**සමස්ථ පිරිවැය ඇස්තමේන්තුවට අනුව ව්‍යාපෘති වර්ගීකරණය (රු.මි.)**

| අරමුදල් ප්‍රභවය | 500< | 50 -500 | 50> | එකතුව |
|---|---|---|---|---|
| විදේශීය | 141 | 29 | 5 | 175 |
| දේශීය | 165 | 350 | 361 | 876 |
| සමස්ථ | 306 | 379 | 366 | 1051 |

රේඛීය අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වන රාජ්‍ය ව්‍යවසායන් හි 2015-2017 ප්‍රතිඵල පාදක රාමුව සකස් කිරීම සඳහා අදාල උපදෙස් මාලාවක් ලබාදීමට පියවර ගෙන ඇත. දෙපාර්තමේන්තු නිළධාරීන්ගේ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා අවශ්‍යතා ඇගයීම් සිදු කර ඇත. ඊට අමතරව දෙපාර්තමේන්තු නිළධාරීන්ගේ දැනුම සහ ව්‍යාපෘති අධීක්ෂණය කිරීමේ ක්‍රමවේද යාවත්කාලීන කිරීම සඳහා පුහුණුවීම් සහ වැඩමුලු 2 ක් පවත්වා ඇත.

රාජ්‍ය ආයෝජන උදෙසා යොදවා ඇති සම්පත් කාර්යක්ෂමව සහ ඵලදායී අන්දමින් උපයෝගී කොට ගන්නා බව තහවුරු කරනු සඳහා මෙම සංවර්ධන ව්‍යාපෘතීන් විධිමත්ව හා අඛන්ඩව අධීක්ෂණය කිරීම හා අවශ්‍ය අවස්ථාවන් හි ඇගයීම සිදු කිරීමේ වගකීම ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. එබැවින් 2015 වර්ෂයේදී දෙපාර්තමේන්තුව සතු විවිධ අධීක්ෂණ ක්‍රමවේදයන් උපයෝගී කර ගනිමින් මෙම ව්‍යාපෘති හා වැඩසටහන් අධීක්ෂණය කිරීමට දෙපාර්තමේන්තුව සමත් වී ඇත.

### 4.1 අධීක්ෂණ ක්‍රමවේදයන්

2015 වර්ෂයේදී මෙම සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතීන් හි ප්‍රගතිය අධීක්ෂණය කිරීමේදී දෙපාර්තමේන්තුව විසින් විද්‍යුත් මෘදුකාංග පද්ධති, ප්‍රගති වාර්තාවන්, ක්ෂේත්‍ර චාරිකා මෙන්ම විශේෂ රැස්වීම් හා සාකච්ඡා හරහා සපයා ගත් දත්ත පදනම් කර ගන්නා ලදී. එක් එක් ක්‍රමවේදයන් යටතේ ලබා ගත් ප්‍රගතිය පහත පරිදි වේ.

#### 4.1.1 දේශීය සහ විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය අධීක්ෂණය කිරීම

අදාළ මුදල් වර්ෂය තුළ දේශීය සහ විදේශීය අරමුදල් මඟින් ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘතීන් හි මාසික ප්‍රගති වාර්තා අනුව එම ව්‍යාපෘතීන් නියමිත කාලසටහනට අනුව ක්‍රියාත්මක වන්නේද, නොවන්නේද, නැතහොත් තාවකාලිකව නැවතී තිබේද යන කරුණු පිළිබඳව මෙම දෙපාර්තමේන්තුව මඟින් අධීක්ෂණය කරනු ලැබේ. තවද එම ව්‍යාපෘතීන් හි සමස්ත ඇස්තමේන්තුගත ප්‍රතිපාදන හා සත්‍ය වියදම්වල ප්‍රගතිය ද විශ්ලේෂණය කර වැඩසටහන් හා ව්‍යාපෘතීන්වල ගැටලු හඳුනා ගනිමින් එම ගැටලු සඳහා අදාළ මග පෙන්වීම්ද සිදු කරනු ලබයි.

එමෙන්ම, දේශීය සහ විදේශීය අරමුදල් මඟින් ක්‍රියාත්මක වන සියළුම සංවර්ධන ව්‍යාපෘතීන් හි ප්‍රගතිය ත්‍රෛමාසිකව විමසා බැලීම සඳහා රේඛීය අමාත්‍යාංශ හා සබැඳි වෙබ් අඩවිගත දත්ත පද්ධතියක් ද දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලැබේ.

### 4.1.2 ප්‍රගති වාර්තා මඟින් අධීක්ෂණය කිරීම

රේඛීය අමාත්‍යාංශ හරහා ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සහ වාර්ෂික සංවර්ධන වැඩසටහන් අදාල අමාත්‍යාංශ මඟින් මාසිකව හා කාර්තුමය ප්‍රගති වාර්තා ලෙස මෙම දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන අතර එම වාර්තා අධීක්ෂණය කරමින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ගැටළු හඳුනා ගැනීමද මෙම දෙපාර්තමේන්තුවේ කාර්යයන්වලට අයත් වේ.

### 4.1.3 ක්ෂේත්‍ර චාරිකා මගින් ප්‍රගතිය අධීක්ෂණය කිරීම

ව්‍යාපෘති අධීක්ෂණයේදී ක්ෂේත්‍ර චාරිකා ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ප්‍රගති වාර්තා මඟින් ලබා ගන්නා තොරතුරුවලට අමතරව දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ක්ෂේත්‍ර චාරිකාවල නිරත වීම තුළින් ද සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වීමේ දී පැන නඟින ගැටළු පිළිබඳව නිවැරදි තොරතුරු ලබා ගනු ලැබේ. මෙම ක්ෂේත්‍ර චාරිකාවලදී ප්‍රතිලාභීන්ගෙන් සහ සංවර්ධන පාර්ශ්වකරුවන්ගෙන් ලබා ගන්නා තොරතුරු, ප්‍රතිචාර සහ සෘජු නිරීක්ෂණයන්හි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘති කිහිපයකම කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාවය ඉහළ නැංවීමට අවශ්‍ය මැදිහත්වීම් දෙපාර්තමේන්තුව මඟින් සිදු කර ඇත.

සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වීමේ යථා තත්ත්වය අවබෝධ කර ගැනීමට ක්ෂේත්‍ර චාරිකා උපකාරී වන අතර, ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය පිළිබඳ සංසන්දනාත්මක විශ්ලේෂණයක් කිරීමේ අවස්ථාවද මෙමගින් උදා වේ. එයට අමතරව ග්‍රාමීය ප්‍රදේශවල පවත්නා සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීමටත්, ඒවා අදාළ බලධාරීන් වෙත යොමු කිරීමටත් මෙමඟින් අවස්ථාව ලැබේ. මෙම කරුණු අනුව දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය ඉහළ නැංවීමට ක්ෂේත්‍ර චාරිකා විශාල බලපෑමක් සිදු කරනු ලබයි. 2015 වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් ක්ෂේත්‍ර චාරිකා 17ක් සිදු කළ අතර නිරීක්ෂණය වූ කරුණු හා ගැටළු පිළිබඳව සලකා බලා සුදුසු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාළ ආයතන හා පාර්ශව වෙත යොමු කර ඇත. මේ අතුරින් බොහෝ ගැටළු ඉතා කඩිනමින් විසඳීමට පියවර ගෙන ඇත.

**වගු අංක 04**
**ක්ෂේත්‍ර චාරිකා මගින් ප්‍රගතිය අධීක්ෂණය කිරීම - 2015**

| අංශය | සිදු කරන ලද ක්ෂේත්‍ර චාරිකා සංඛ්‍යාව | අදාල පාර්ශවයන්ගේ අවධානයට යොමු කළ ගැටළු |
|---|---|---|
| කෘෂිකර්ම, වාරිමාර්ග හා පාරිසරික සංවර්ධන අංශය | 01 | 08 |
| ආර්ථික යටිතල පහසුකම් සංවර්ධන අංශය | 07 | 01 |
| මානව සම්පත් සංවර්ධන අංශය | 03 | 03 |
| රාජ්‍ය පාලන කර්මාන්ත හා මුදල් අංශය | 06 | 02 |
| එකතුව | 17 | 14 |

**ගාල්ල බලශක්ති සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය**





**ජාතික මහාමාර්ග අංශික ව්‍යාපෘතිය**





**මාලිගාවත්ත වකුගඩු රෝහල නිරීක්ෂණය කිරීම**





**ගුදම් කුච්චාන්සි මුලාා කළමනාකරණ ව්‍යාපෘතිය**







## 4.1.4 විශේෂ රැස්වීම් සහ සාකච්ඡා පැවැත්වීම

විශාල පරිමාණයේ සංවර්ධන ව්‍යාපෘතීන් හි ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා 2015 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන්, කොන්ත්‍රාත්කරුවන්, විදේශ ආධාර සපයන පාර්ශවකරුවන්, රේඛීය අමාත්‍යාංශ නිලධාරීන් සහ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අනෙකුත් දෙපාර්තමේන්තුවල නියෝජිතයින්ගේද සහභාගීත්වයෙන් විශේෂ රැස්වීම් සහ සාකච්ඡා ගණනාවක් පවත්වන ලදී.

ඒ අනුව ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් මත ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘතීන් හි ප්‍රගති සමාලෝචන රැස්වීම් 2 ක් මෙම දෙපාර්තමේන්තුව විසින් ආසියානු සංවර්ධන බැංකුවේ නිළධාරීන්ගේ සහභාගීත්වයෙන් 2015 ජුනි 4,5 සහ 2015 නොවැම්බර් 3,4 යන දිනයන් හි මිලෝදා ආයතනයේදී පවත්වන ලදි. ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් මෙන්ම, එම අමාත්‍යාංශයේ උපදේශක සහ ආසියානු සංවර්ධන බැංකුවේ නේවාසික අධ්‍යක්ෂතුමිය ද මෙම රැස්වීම් මාලාවේ මුලසුන ගන්නා ලදි.

ව්‍යාපෘතීන් සඳහා වෙන් කරන ලද අයවැය යටතේ නියමිත කාලය තුළ එම ව්‍යාපෘතීන් නිම කිරීම පදනම් කරගෙන ආයෝජනයන් හි කාර්යසාධනය විමර්ෂණයට ලක්කල අතර, ව්‍යාපෘතීන්ට බලපාන කැපී පෙනෙන පොදු ප්‍රශ්නද සාකච්ජාවට බඳුන් විය. සමාලෝචනයේ ප්‍රධාන අරමුණ වූයේ කල්පවත්නා නොවිසුදුනු ගැටලු පිළිබඳ මනා කළමණාකාරීත්වයකින් යුතුව විසඳා ගැනීම සඳහා උපදෙස් ලබාදීමයි.

මීට අමතරව, වෙනත් රේඛීය අමාත්‍යාංශ විසින් සංවිධානය කරන ලද ජල සම්පාදන, විදුලිබල, වාරිමාර්ග, මහා මාර්ග වැනි අංශයන් හි සංවර්ධන ව්‍යාපෘතිවල සාර්ථක ප්‍රතිඵල තහවුරු කිරීම සඳහා මෙම එක් එක් ව්‍යාපෘතීන් හි මෙහෙයුම් කමිටු රැස්වීම්, ප්‍රගති සමාලෝචන රැස්වීම් සහ සාකච්ඡා සඳහා දෙපාර්තමේන්තුවේ අදාළ අංශවල නිලධාරීන් සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත.

තවද, දෙපාර්තමේන්තු නිලධාරීන් එක් එක් ව්‍යාපෘති සම්බන්ධව ඊට අදාල ආයතන විසින් පවත්වන ලද රැස්වීම් හා සාකච්ඡාවන් සඳහා සහභාගීවෙමින් අධීක්ෂණ කටයුතු සිදුකර ඇත.

**වගු අංක 05**
**2015 වර්ෂයේ දී පවත්වන ලද විශේෂ රැස්වීම් සහ සාකච්ඡා**

| රැස්වීම් / සාකච්ඡා වර්ගීකරණය | සංඛ්‍යාව |
|---|---|
| ප්‍රගති සමාලෝචන රැස්වීම් | 25 |
| ආංශික රැස්වීම් | 1 |
| අරමුදල් සපයන ආයතන සමඟ පවත්වන රැස්වීම් | 26 |
| මෙහෙයුම් කමිටු රැස්වීම්/ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටු රැස්වීම් | 48 |
| වෙනත් විශේෂ රැස්වීම්/සාකච්ඡා | 46 |
| එකතුව | 146 |

**විදේශ ආධාර සපයන පාර්ශවකරුවන් සමග පැවැත්වූ ප්‍රගති සමාලෝචන රැස්වීම**






### 4.1.5 ඇගයීම් තොරතුරු පද්ධතිය (EIS) පවත්වාගෙන යාම

දේශීය සහ විදේශීය අරමුදල් මත ක්‍රියාත්මක වන සහ නිම කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන්වල ඇගයීම් වාර්තාවන්හි සංක්ෂිප්ත විස්තර ඇතුලත් කිරීම සඳහා වෙබ් අඩවිගත ඇගයීම් තොරතුරු පද්ධතියක් දෙපාර්තමේන්තුව විසින් සකස් කර ඇත. මෙම තොරතුරු පද්ධතියේ මූලික අරමුණ වන්නේ ව්‍යාපෘති ඇගයීම් මගින් හෙළි වන කරුණු, නිරීක්ෂණ සහ අධ්‍යයනයන් ඇසුරින් ලබා ගත්

දැනුම සහ උගත් පාඩම්, අයවැය සකස් කිරීමේදී, ප්‍රතිපත්ති සම්පාදනය සහ සැලසුම්කරණය වැනි කටයුතුවලදී වඩාත් ඵලදායි ලෙස භාවිතයට ගැනීම සහතික කිරීමයි. ඇගයීම් සිදු කරන ලද ව්‍යාපෘති 50 ක වාර්තා දැනට මෙම වෙබ් අඩවිගත තොරතුරු පද්ධතියට ඇතුළත් කර ඇති අතර, 2015 වර්ෂය තුලදී ව්‍යාපෘති 04 ක් ඇගයීමට ලක් කර ඇත.

### 5.0 එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ වූ තාක්ෂණික සහයෝගීතා ව්‍යාපෘතිය (ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති අධීක්ෂණය හා ඇගයීම පිළිබඳ හැකියාව උපායමාර්ගිකව ඉහළ නැංවීම)

මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, ව්‍යාපෘති සම්බන්ධීකරණය, අධීක්ෂණය, ඇගයීම හා අදාල ගැටළු නිරාකරණය කිරීමට අදාලව වඩාත් ඵලදායී කාර්යභාරයක් උපායමාර්ගිකව ඉටු කිරීමට හැකි වන පරිදි ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීමයි.

2015 වසර තුල, මෙම ව්‍යාපෘතිය මගින් පහත සඳහන් කාර්යභාරයන් ඉටු කරන ලදී.

1. දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය කිරීම සඳහා, ඉහත සඳහන් ව්‍යාපෘති ඇගයීම් සිදු කිරීමට පහසුකම් සපයන ලදී.
2. එම ඇගයීම් වාර්තා, පාර්ශ්වකරුවන් සම්බන්ධ වූ වැඩමුළුවක් තුලදී සාකච්ඡාවට බඳුන් කල අතර එහිදී ඔවුන්ගෙන් ලබා ගන්නා ලද අදහස් වාර්තාව පිළියෙල කිරීම සඳහා ඉවහල් කර ගන්නා ලදී.

### 6.0 විශේෂ ක්‍රියාකාරකම්

#### 6.1 "සංවර්ධන ව්‍යාපෘතීන්හි කාර්යසාධනය - 2015" ප්‍රකාශයට පත් කිරීම

දේශීය අරමුදල් හා විදේශීය ණය හා ප්‍රදාන මත ක්‍රියාත්මක වන සියළුම සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය අමාත්‍යාංශ මට්ටමෙන් ඇතුළත් කරන ලද "සංවර්ධන ව්‍යාපෘතීන්හි කාර්යසාධනය - 2015" අර්ධ වාර්ෂිකව හා වාර්ෂිකව ප්‍රකාශයට පත් කරන ලදී.

#### 6.2 දිස්ත්‍රික්ක සම්බන්ධීකරණ කමිටු මගින් ක්‍රියාත්මක වූ සංවර්ධන ව්‍යාපෘති ඇගයීම

ග්‍රාමීය ජනතාවගේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මෙන්ම අධ්‍යාපන හා සෞඛ්‍යය වැනි ගුණාත්මක සංවර්ධනයක් ඇතිකිරීම සඳහා ද 2015 වර්ෂයේ නව රජය ප්‍රමුඛතාවය ලබාදෙන ලදී. 2015 වර්ෂය ආරම්භයේදී පැවති රේඛීය අමාත්‍යාංශවල විෂයපථය වෙනස්වීම් හා ව්‍යාපෘතිවල හිමිකාරීත්වය වෙනස්වීම් මත අරමුදල් මුදා හැරීමේ සංකූලතාවයන් හා ගැටලු ඇති විය.

එම නිසා 2014 වර්ෂයේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු මගින් ක්‍රියත්මක වූ වැඩ අවසන් නොකරන ලද සංවර්ධන යෝජනා පිළිබඳ විශේෂ ඇගයීමක් හා විමර්ෂණයක් සිදු කොට මුදල් අමාත්‍යාංශය වෙත වාර්තාවක් ලබාදීමට මෙම දෙපාර්තමේන්තුවට උපදෙස් ලබා දෙන ලදි. ඒ අනුව මෙම දෙපාර්තමේන්තුවේ නිළධාරීන් කණ්ඩායම් කිහිපයක් කොළඹ, මාතර, පොලොන්නරුව හා නුවර යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වූ සංවර්ධන ව්‍යාපෘතීන් පිළිබඳව විශේෂ විමර්ශනයක් හා ඇගයීමක් සිදුකර මුදල් අමාත්‍යාංශය හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත වාර්තාවක් ලබා දෙන ලදි.

## 6.3 දින 100 වැඩසටහන

දින 100 සංවර්ධන වැඩසටහන 2015 වර්ෂයේ ජනාධිපතිවරණයේදී ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කළ යෝජනා 100 කින් සමන්විත ක්ෂණික සහන ඇතුලත් සංවර්ධන වැඩසටහනකි. නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සාරාංශයක් ලෙස ඉදිරිපත් කරන ලද **"දින 100 න් නව දේශයක්"** යන්න අරමුණු කරගෙන දින වකවානු සදහන් කරමින් එම සංවර්ධන යෝජනා එක් එක් අමාත්‍යාංශය මගින් ක්‍රියාවට නංවන ලදි.

මෙම සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය 2015.02.02 දින සිට 2015.04.23 දක්වා සතිපතා අධීක්ෂණය කිරීම හා ප්‍රගතිය වාර්තා කිරීම දෙපාර්තමේන්තුව මගින් සිදුකරන ලදී. මීට අමතරව එම වැඩසටහනේ මාසික ප්‍රගතිය ද අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලද අතර, එම ප්‍රගති වාර්තා දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කර ඇත.

## 6.4 පෝෂණ වැඩසටහන

ගර්භණී මව්වරුන්ගේ හා ළදරුවන්ගේ මන්දපෝෂණය දුරලීම, නීරෝගී සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහි කිරීම යන අරමුණින්, පෝෂණ වැඩසටහන 2015 වසරේදී ක්‍රියාත්මක කරන ලදි. කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතිය මගින් ගර්භණී මාතාවන්ට රු20,000 ක පෝෂණ මල්ලක් ලබාදිම නිර්දේශ කරන ලදි. දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකම සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලයන්හි ලියාපදිංචි වී ඇති ගර්භණී මව්වරුන්ට මසකට රු 2,000 ක් වටිනා පෝෂණ මල්ලක් ගැබිනි සමයේ අවසන් මාස හයක් සහ දරුවා ඉපදී මාස හතරක් ගතවනතුරු මාස දහයක් ලබා දෙන ලදී.

අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලයේ උපදෙස් පරිදි, මෙම වැඩසටහනේ ප්‍රගතිය අධීක්ෂණය හා ඇගයීම මෙම දෙපාර්තමේන්තුවෙන් සිදුකරන ලදී. මේ සඳහා හම්බන්තොට, අනුරාධපුර හා මොණරාගල යන දිස්ත්‍රික්ක තුනක් තෝරාගෙන සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලයන්හි ලියාපදිංචි ගර්භණී මව්වරුන්ගේ හා ළදරුවන්ගේ උපත් බර පිළිබඳව තොරතුරු ලබා ගනිමින් ඇගයීමක් කර ඒ පිළිබඳව අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලයට වාර්තා කරන ලදී.

## 7.0 කාර්යමණ්ඩල පුහුණු කිරීම සහ හැකියා වර්ධනය

දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ හැකියා වර්ධනය කිරීම උදෙසා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර එහි දී ව්‍යාපෘති සැලසුම් කිරීම, අධීක්ෂණය සහ ඇගයීම ඉලක්ක කර ගත් දේශීය සහ විදේශීය පුහුණු වීම් සඳහා අවස්ථාව ලබා දෙන ලදි. සියළුම පුහුණු වැඩමුළු අවසන් කිරීමෙන් පසු එම පුහුණුවීම් තුළින් ලබා ගන්නා ලද දැනුම සහ කුසලතා අන් අය සමග හුවමාරු කරගැනීමේ අවස්ථාව නිලධාරීන්ට ලබා දෙන ලද අතර එය ඔවුන්ගේ ඉදිරිපත් කිරීමේ හැකියාවන් වර්ධනය වීම සඳහා ද ඉවහල් විය.

2015 වර්ෂය තුළ දෙපාර්තමේන්තුව් නිලධාරීන් සහභාගී වූ දේශීය හා විදේශීය පුහුණු හා වැඩමුළු පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

**වගු අංක 06**
**කාර්ය මණ්ඩල පුහුණුව - 2015**

| පුහුණු වැඩසටහන | දේශීය / විදේශීය | සහභාගී වූ නිලධාරීන් ගණන |
|---|---|---|
| කෙටි කාලීන පුහුණු වීම් | විදේශීය | 08 |
| දිගු කාලීන පුහුණු වීම් | විදේශීය | 01 |
| දිගු කාලීන පුහුණු වීම් | දේශීය | 01 |
| කෙටි කාලීන පුහුණු වීම් | දේශීය | 171 |
| දෙමළ භාෂා පුහුණු පාඨමාලා | දේශීය | 15 |
| සිංහල භාෂා පුහුණු පාඨමාලා | දේශීය | 04 |
| එකතුව | | 200 |